GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

2014/10/18

**මාධ්‍ය නිවේදනයයි**

දිවයිනේ බොහෝ නගර සභා සීමා තුල මහජන සෞඛ්‍ය සේවා කටයුතු පහසු කිරීම සඳහා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට අයත් කාර්ය මණ්ඩල අනුයුක්ත කර ඇත. මේ නිලධාරින් අතර වෛද්‍ය නිලධාරින්, මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන්, පවුල් සෞඛ්‍ය සේවා නිලධාරින් සිටිති. මෙම සියලු දෙනා වෛද්‍යවරුන් ප්‍රධාන කොටගත් කණ්ඩායමක් ලෙස සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්ගේ තාක්ෂණික මග පෙන්වීම යටතේ සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නීති රීති හා රෙගුලාසි අනුව තම රාජකාරි කටයුතු කරගෙන යනු ලබයි.

මෙම පිළිගත් සම්මතයන් උල්ලංඝණය කරමින් කටයුතු කරන අවස්ථාවක් ගාල්ල මහ නගර සභාවෙන් වාර්ථා වේ. නගර සභාවේ දේශපාලන බලධාරින්ට ගැති කම් කරන එක්තරා මහජන සෞඛ්‍ය පරික්ෂකවරයෙකු දැනට රාජකාරිය පිළිබඳ චෝදනා ලැබ, මූලික විමර්ෂණයකට ලක්ව ඇත. මෙම මහජන සෞඛ්‍ය පරික්ෂකවරයාට සෞඛ්‍ය වෛද්‍ය නිලධාරින්ගේ අනුමැතියකින් තොරව සෘජුවම ගව ඝාතකාගාරය පරික්ෂා කිරීමට අවසරයක් නගර සභාවේ දේශපාලන බලධාරින් ලබා දී ඇත. මෙය පවතින සම්මතයන්ට අභියෝගයක් වන අතර  සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ තාක්ෂණික මග පෙන්වීමට සිදු කල නිගාවකි. නගර සභා බලධාරින් නගර සභා බල සීමාව තුල සෞඛ්‍යමය කරුණු  වලදී සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීවරයාගේ  තාක්ෂණික මග පෙන්වීම පිලිගත යුත්තේ ඒ පිළිබඳ නිසි සෞඛ්‍යමය දැනුමක් ඒ අයට නොමැති නිසාය.

මෙම මහජන සෞඛ්‍ය පරික්ෂකවරයා පිළිබඳ මහජන සෞඛ්‍ය පරික්ෂකවරුන්ගේ සංගමයේද පැහැදීමක් නැත. මේ පිළිබඳව ගාල්ල දිස්ත්‍රික් රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමය අදාල බලධාරින්ට දැනුම් දී ඇතත් මෙම  අකටයුත්ත නිවැරදි කර නැත. මෙම අක්‍රමිකතාවය නිවැරදි කරන තෙක් තම රාජකාරී වලින් ඉවත්ව සිටීමට ගාල්ල මහ නගර සභාවේ සේවයට අනුයුක්ත වෛද්‍ය නිලධාරින් තීරණය කර ඇත. එම නිසා සිදුවන සේවා බිඳ වැටීම් පිළිබඳ වගකීම නගර සභාවේ දේශපාලන බලධාරින් භාර ගත යුතුය.

ස්තුතියි,

වෛද්‍ය ලසන්ත පිනදාස
ලේකම්

| | | |
|---|---|---|
| වැඩිදුර විස්තර සඳහා - | වෛද්‍ය හරිත අළුත්ගේ | - 0718121619 |
| | වෛද්‍ය නලින්ද හේරත් | - 0773495821 |
| | වෛද්‍ය සමන්ත ආනන්ද | - 0777666301 |